ප්‍රසම්පාදන දැන්වීමයි

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
මහරෝහල ( ශික්ෂණ ) පේරාදෙණිය
2023 වර්ෂය සඳහා ගලහ ජාතික භික්ෂු ගිලානෝපස්ථාන
මධ්‍යස්ථානය වෙත අමු ආහාර සැපයීම

මෙම ආයතනයට අනුබද්ධිත ඉහත ආයතනය වෙත 2023 වර්ෂය සඳහා අමු ආහාර ද්‍රව්‍ය සැපයීමේ කොන්ත්‍රාත්තුව පවත්වා ගෙන යෑම සඳහා සුදුසුකම් ලත් සැපයුම්කරුවන්ගෙන් පේරාදෙණිය මහරෝහලේ ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් 2023.04.10.දින පෙ.ව. 10.30 දක්වා මුද්‍රා තැබූ ලංසු භාර ගනු ලැබේ.

02. 2023.03.20.දින සිට 2023.04.09 දින දක්වා රාජකාරි දිනයන්හි පෙ.ව. 9.30 සිට ප.ව. 2.30 දක්වා ද 2023.04.10.දින පෙ.ව. 10.30 දක්වා ද පේරාදෙණිය මහ රෝහලේ ප්‍රධාන කාර්යාලය වෙතින් ලංසු ලේඛන ලබාගත හැකිය. ඒ සඳහා පහත සඳහන් ලියවිලි ඉදිරිපත් කලයුතු වේ.

(අ) පේරාදෙණිය මහ රෝහලේ ප්‍රසම්පාදන කමිටු සභාපති වෙත ලිඛිත ඉල්ලීමක්

(ආ) ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ සහතික කළ පිටපතක්

(ඇ) රු. 2500.00 ක ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුවක් පේරාදෙණිය මහ රෝහලේ සරප් වෙත ගෙවා ලබාගත් රිසිට් පතක්

(ඉ) කොන්ත්‍රාත්කරු පදිංචි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම් වෙතින් ලබා ගත් පොදු 170 ආකෘතියේ රු.1,000,000.00/= ක වටිනාකමට සරිලන ඉදිරියට මාස 06 ක් වලංගු වත්කම් සහතිකයක්

අදාළ ලියකියවිලි ඉදිරිපත් කිරීමෙන් පසුව ගාස්තු ගෙවීමකින් තොරව ලංසු ලේඛන පරික්ෂා කිරීම සිදු කළ හැකිය.

3. නියමිත පරිදි සම්පූර්ණ කරන ලද ලංසු ලියකියවිලි "මුල් පිටපත"සහ" අනු පිටපත" වශයෙන් සලකුණු කර මුද්‍රා තබන ලද කවර දෙකක බහා ඉන් පසුව එම කවර දෙක එක් කවරයක බහා මුද්‍රා තබා කවරයේ ඉහළ වම් කෙළවරේ " ගලහ ජාතික භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථානයට අමු ආහාර සැපයීම 2023" ලෙස සඳහන් කර 2023.04.10.දින පෙ.ව. 10.30 හෝ ඊට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ අතින් ගෙනවිත් ගණකාධිකාරී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට හෝ හැකිය.

4 ලංසු භාර ගැනීම අවසන් කළ වහාම ලංසු විවෘත කරන අතර ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට එම අවස්ථාවට සහභාගී වීමට අවසර දෙනු ලැබේ

5. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. ලංසු සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතුය.

7 ප්‍රසම්පාදන කමිටුවේ තිරණය අවසන් තිරණයවේ.

8 මේ සම්බන්ධයෙන් වන වැඩිදුර විස්තර දුරකථන අංක 081 – 2388001 අමතා ලබා ගත හැක.

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව
මහරෝහල,පේරාදෙණිය.
2023.03.20